## (ඒ) 1963 පාරිභෝගිකයන්ගේ ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණය.

පාරිභෝගිකයන් ගේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රථම ද්වීප ව්‍යාප්ත සමීක්ෂණය 1953 දී මහ බැංකුව විසින් පවත්වන ලදී. මෙම සමීක්ෂණය කරන ලද්දේ, ආදායම් හා වියදම් සංඛ්‍යා ලේඛන පිළිබඳව එවකට පැවති විශාල අඩුපාඩුව පිරිමසා ගැනීම සඳහාය. එකී සමීක්ෂණයෙන් ලැබුන තොරතුරු ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රම සම්පාදන කටයුතු වලදීත්, ආදායම් පන්ති අනුව බදු බර පිළිබඳව හා විවිධ ආදායම් ගණයන් අනුව ආදායම් ව්‍යාප්තිය හා පරිභෝජන රටාව පිළිබඳව කරන ලද හැදෑරීම් වලදීත් අතිශයින්ම ප්‍රයෝජනවත් විය.

ආදායම් ව්‍යාප්ත වන පිළිවෙලෙහි හා පරිභෝජන රටාවෙහි වෙනස්කම් හැදෑරීම සඳහා එම තොරතුරු වලට අතිරේක වශයෙන් අළුත්ම තොරතුරු රැස් කිරීමට 1963 දී තීරණය කරන ලදී. ඒ අනුව, පාරිභෝගියෙකු ගේ ආදායම හා වියදම් පිළිබඳ දෙවන ද්වීප ව්‍යාප්ත සමීක්ෂණය 1964 දී මහ බැංකුව විසින් පවත්වන ලදී.

සමීක්ෂණයෙන් ලද මූලික ප්‍රතිඵල දක්වෙන වාර්තාවෙහි පළමුවැනි කොටස 1964 දී ප්‍රසිඩ කරන ලදී. සංඛ්‍යා සටහන් දක්වෙන දෙවන කොටස දැනට මුද්‍රණය වෙමින් පවතී.

සමීක්ෂණයට අනුව, පවුලක සාමාන්‍ය සංඛ්‍යාව පුද්ගලයන් 5·75 ක් බවද එක් පවුලකට වැය ඒකක එනම්, එක්ව ජීවත්වන හා එක්ව පරිභෝජනය සඳහා කැරෙන වියදම් වලින් වැඩි කොටසක් කරන, ඒකක 1·08 ක් ඇති බවත් අනාවරණය විය. සාමාන්‍ය වශයෙන්, එක් පවුලකට ආදායම් ලබන්නන් 1·56 ක් සිටි අතර, යැපෙන්නෝ 4·19 ක් සිටියහ. සෑම පවුල් සියයකම පුද්ගලයින් 437 දෙනෙක් ලබා තිබුනේ, ද්විතීය මට්ටමට අඩු අධ්‍යාපනයකි. 115 දෙනෙක් ද්විතීය අධ්‍යාපනය ලබා තිබූ අතර, 23 දෙනෙක්, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ උසස් අධ්‍යාපනයක් ලබා තිබුණි. සෑම පවුල් 100 කම 159 දෙනෙක් රැකියාවල නියුක්තව සිටි අතර, 25 දෙනෙකුට රැකියා නො තිබුණි.

එක් පවුලකට දෙමසකට ලැබෙන සාමාන්‍ය ආදායම රුපියල් 416·19 කි වැය ඒකකයකට ලැබෙන ද්විමාසික සාමාන්‍ය ආදායම රුපියල් 385·36 ක් විය. මෙම ආදායමෙන් වැඩි කොටසක් (එනම් සියයට 76 ක්) ලැබුනේ ප්‍රධාන රැකියාවෙනි. මෙම ආදායමෙන් සියයට 10 ක් අතුරු රැකියාවන්ගෙන් ද, තවත් සියයට 10 ක් දේපල ආදායම් වලින් (එනම් ගෙවල් කුලී, ලාභාංශ හා පොළී) ද ලැබුන අතර, පැවරුම්, හා අනෙකුත් ආදායම් වලින් ඉතිරි සියයට 4 ලැබුනේය.

දෙමසක් සඳහා වැය ඒකකයකට යන මුළු වියදම රුපියල් 382·07 කි. ආහාර සඳහා වියදම රුපියල් 214·85 කි. මින් රුපියල් 58·96 ක් ධාන්‍ය වර්ග හා ධාන්‍ය වලින් පිළියෙළවූ ආහාර සඳහා ද, රුපියල් 33·72 ක් මස්, මාළු හා බිත්තර සඳහාද, රුපියල් 26·55 ක් එළවළු හා පළතුරු සඳහාද, රුපියල් 21·23 ක් සීනි සඳහාද වැය වෙයි. ආහාර නොවන ද්‍රව්‍ය සඳහා දෙමසකට යන වියදම රුපියල් 167·22 ක් වන අතර ඉන් රුපියල් 36·38 ක් රෙදිපිළි සඳහාද රුපියල් 27·86 ක් නිවාසය සඳහා ද, රුපියල් 31·92 ක් බුලත්, දුම්කොළ හා මද්‍යසාර සඳහාද, රුපියල් 17·03 ක් ඉන්ධන සහ එළිය සඳහා ද වැය වෙයි.

සාමාන්‍ය ද්විමාසික ආදායම සාමාන්‍ය වියදමට වඩා රුපියල් 3·29 කින් වැඩි විය. 1962/63 මුළු වර්ෂයම සමීක්ෂිත කාලඡේදය ලෙස සලකා බලනවිට දෙමසක් සඳහා ආදායමෙන් සියයට 3·8 කින් හෙවත් රුපියල් 14·52 කින් ඉතුරු කිරීම් අඩුවිය. පෞද්ගලික ඉතිරි කිරීම් වලින් වැඩි කොටසක් සමන්විත වූයේ ජීවිත රක්ෂණ වාර මුදල් හා අර්ථ සාධක අරමුදල සඳහා වූ දායක දීමනා ආදී වශයෙන් වූ ගිවිසගත් ඉතිරි කිරීම වලිනි.

1962/63 එක් අවුරුදු සමීක්ෂිත කාලච්ඡේදය තුළ දී එක් වැය ඒකකයක් ණයට ගත් සාමාන්‍ය මුදල, ඉතුරු කිරීම් වලින් අඩුකළ ප්‍රමාණයට වඩා විශාල විය. දෙමසක් සඳහා ගනු ලැබූ ණය මුදල රුපියල් 23·79 ක්වූ අතර, මෙම ණය සඳහා ගෙවන ලද සාමාන්‍ය පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් විය. වැය ඒකක වලින් සියයට 47·32 ක් මෙම කාලපරිච්ඡේදය තුළ දී ණය ගැතිව සිටි බැව් ඔවුන් විසින් වාර්තා කරන්නට යෙදුන බැව් මෙහිලා සැලකිය යුතු කරුණකි.